ඉඩම්, පළාත් වාරිමාර්ග කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය හා ධීවර කටයුතු අමාත්‍යාංශය

## සබරගමුව පළාත් සභාව

# සබරගමුව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති)
# III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

1.0 සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) III වැනි ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 සබරගමුව පළාත් ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය හා ධීවර අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල පදනම් කරගනිමින් කුසලතා අනුපිළිවෙළ මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 අනුව දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් සබරගමුව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහයක (කෘෂි ව්‍යාප්ති) III වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත. විභාගය 2018 ජූලි මස දී පැවැත්වීමට නියමිතය.

3.0 පත්කරනු ලබන සංඛ්‍යාව, පත්වීම ක්‍රියාත්මක වන දිනය සහ කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම නොපිරවීම පිළිබඳ අවසාන තීරණය ගැනීමේ බලය සබරගමුව පළාත් ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය හා ධීවර අමාත්‍යාංශයේ ලේකම් සතුය.

4.0 තනතුරට හිමි වැටුප් පරිමාණය : අංක 03/2016 හා 2016. 02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, සරබගමුව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 29840-10X300-11X350-10X560-10X660-48890/= ක් වන අතර, එම වැටුප හිමිවන්නේ 2020.01.01 දින සිට වේ. ඉහත චක්‍රලේඛයේ උපලේඛන 11 හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

5.0 මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතු වේ.

6.0 සුදුසුකම්

(අ) අධ්‍යාපන සුදුසුකම් :

භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම් :

රජය විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන ද්‍ෙ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාවක් ලබා තිබීම. **හෝ**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2012 ප්‍රකාරව අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම්වල 05 වන මට්ටමේ පාඨමාලා සහිතකය (NVQ) ලබා තිබීම. **හෝ**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඒ හා සමාන යැයි පිළිගනු ලබන සුදුසුකමක් ලබා තිබීම.

(ඇ) 2018.06.04 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතු අතර, සෑම අයදුම්කරුවෙකුම අදාළ සියලූ සුදුසුකම් 2018.06.04 දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ (ඒ අනුව 2000.06.04 දින හෝ ඊට පෙර හා 1983.06.04) දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

(ඈ) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන දිනට අයදුම්කරු සබරගමුව පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 තුළ අයදුම්කරුට පළාතේ වසර 03 ක ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(ඉ) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

7.0 විභාග පරිපාටිය

විභාග ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වන අතර, මෙම විභාගය සිංහල, දෙමළ මාධ්‍ය වලින් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරාගත යුතු අතර, විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | **ලකුණු** | **කාලය** |
|---|---|---|
| **බුද්ධි පරීක්ෂණය** | 100 යි | පැය 01 යි |
| **පොදු පරීක්ෂණය<br>(තාක්ෂණ සහ විෂයානුබද්ධ පරීක්ෂණය)** | 100 යි | පැය 01යි |

විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයන්ගේ සිතීමේ තර්කානුකූල භාවයන්ද, විශ්ලේෂණ හැකියාවද, තීරණ ගැනීමේ ශක්තියද තීරණය කිරීම සඳහා බහුවරණ සහ කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න පතහකින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි. |
| පොදු පරීක්ෂණය | 1. ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනය සඳහා කෘෂි කර්මාන්තයේ දායකත්වය දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය, රැකියා වියුක්තිය හා කෘෂි කර්මාන්තයේ අපනයන හා ආනයන තත්ත්වය.<br>2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම.<br>3. පස හා ශාක පෝෂණය<br>පසේ ව්‍යුහය, වයනය, භෞතික හා රසායනික ලවණතාවය හා බෝග වගාව කෙරෙහි බලපෑම සහ ශාක පෝෂණය, පාංශු/ ශාක පෝෂණය කළමනාකරණය, පැලෑටි පෝෂණ පිළිබඳ විශේෂ කරුණු<br>4. වී නිෂ්පාදනය<br>වී නිෂ්පාදනයට අදාළ පාංශු සහ දේශගුණික අවශ්‍යතා, ප්‍රභේද, බිම සකස් කිරීම හා තවාන් පාලනය, පළිබෝධ හා රෝග මර්දනය, පොහොර යෙදීම, ජල කළමනාකරණය/ අස්වනු වැඩිකර ගැනීමේ නූතන ක්‍රමවේදය සහ අස්වනු නෙළීම හා පසු අස්වනු තාක්ෂණය.<br>5. වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය<br>ලොකු ළූණු, මිරිස් අර්තාපල් බඩඉරිඟු සහ වෙනත් බෝගවල ප්‍රභේද<br>6. එළවළු නිෂ්පාදන<br>එළවළු තවාන් පාලනය, එළවළු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු අස්වනු නෙළීම හා සැකසීම.<br>7. පළතුරු<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඇති පළතුරු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු සහ අස්වනු නෙළීම හා සැකසීම.<br>8. භෝග ආරක්ෂණය<br>භෝග වගාවට වැළදෙන ප්‍රධාන රෝග හා පළිබෝධ හඳුනා ගැනීම ඒවායේ පාලන විධි, වල් මර්දනය, වල් මර්දන ක්‍රම, පළිබෝධ නාශක පාලනයේදී පිළිපැදිය යුතු ආරක්ෂිත ක්‍රම.<br>9. ජල වහනය හා එහි වැදගත්කම<br>10. පාංශු රසායනය<br>පාංශු සංරක්ෂණයේ වැදත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම.<br>11. වාරිමාර්ග හා ජල කළමනාකරණය<br>විවිධ භෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය හා ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම.<br>12. ගොවිපල් යාන්ත්‍රීකරණය<br>ගොවිපල් යාන්ත්‍රීකරණයේ වාසි අවාසි, අස්වනු නෙළීම හා පසු අස්වනු තාක්ෂණය, ජල සම්පාදනය හා පැලෑටි ආරක්ෂණය සඳහා භාවිත කරන කෘෂි යන්ත්‍රෝපකරණ හා අදාළ යන්ත්‍ර ක්‍රියාකරවීම හා නඩත්තුව.<br>13. මී මැසි පාලනය<br>ආර්ථික වැදගත්කම, මී මැසි ගෘහ ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම, අස්වනු ලබා ගැනීම හා වෙළඳ පොළට සකස් කිරීම.<br>14. මල් වගාව හා භූමි අලංකරණය<br>ආර්ථික වැදගත්කම, භූමි අලංකරණ කටයුතු ක්‍රම, වෙළඳ පොළ සඳහා කැපූ මල් නිෂ්පාදනය හා ඒවා වෙළඳ පොළට සකස් කිරීම.<br>15. ආරක්ෂිත භෝග වගාව<br>වැදගත්කම, සැලසුම් කිරීම, භෝග තෝරා ගැනීම හා පවත්වා ගෙන යාම හා අස්වනු සකස් කිරීම.<br>16. සත්ත්ව පාලනය<br>කුකුල් පාලනය හා කිරි ගව නිෂ්පාදනය සහ සමෝදන ගොවිපල් පාලනය යටතේ ඉහත සඳහන් සත්ත්ව නිෂ්පාදන පවත්වාගෙන යාම.<br>17. කෘෂිකාර්මික ව්‍යාප්තිය<br>කෘෂිකාර්මික ව්‍යාප්ති උපාය මාර්ග හා ක්‍රමවේදය සහ සන්නිවේදන ක්‍රම.<br>18. පටක රෝපණය<br>පටක රෝපණයේ මූලික සිද්ධාන්ත හා අතීත තොරතුරු පිළිබඳ දැනුම. භාවිතයන්/ යෙදීම, උදාහරණ සහ පටක රෝපණයේ වාසි අවාසි<br>19. පැලෑටි නිරෝධායනය පිළිබඳ දැනුම<br>පැලෑටි නිරෝධායන රෙගුලාසි පිළිබඳ දැනුම සහ පැලෑටි නිරෝධායන ක්‍රම.<br>20. ශාක සංරක්ෂණය<br>ශාක සංරක්ෂණයේ වැදගත්කම හා ක්‍රම (ශාක/ ජාන ප්ලාස්ම)<br>21. ජෛව තාක්ෂණය<br>DNA වල වැදගත්කම, ජානය යනු කවරක්ද, එහි ක්‍රියාකාරීත්වය සහ ඉංජිනේරු ශිල්ප ක්‍රම මගින් ශාක වැඩි දියුණු කිරීමට ඇති හැකියා<br>22. කෘෂිකර්ම සංවර්ධනය<br>වර්තමාන කෘෂිකර්ම සංවර්ධන ප්‍රතිපත්ති, ඒවායේ ඇති වැදගත්කම කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන්, කෘෂිකර්ම සංවර්ධනය හා සම්බන්ධ රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන, මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන, මධ්‍යස්ථාන, අංශ, ඒකක හා ඒවායේ කාර්යභාරය, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්තමාන ගැටලූ හා අභියෝග, කෘෂිකාර්මික සංවර්ධනය රටේ සංවර්ධනයට ආධාර වන ආකාරය, කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්වල යහපත් හා අයහපත් බලපෑම්. |

**සටහන :**

මෙම විභාගය තරග විභාගයක් වුවද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන්කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක් වත් (40%) අපේක්ෂකයන් විසින් ලබාගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක් වත් (50%) ලබාගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් මුළු ලකුණු මත පදනම් වූ දිස්ත්‍රික් කුසලතා අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම ලබාදෙනු ලැබේ.

8.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්

ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

9.0 විභාග ගාස්තු

විභාග ගාස්තුව රු. 600/= කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/ දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැර වන ලෙසය ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම්, මුද්දර භාරගනු නොලැබේ. මුදල් ගෙවා ලබාගත්තා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟතබා ගත යුතුවේ.

10.0 විභාගය පැවැත්වීමට යෝජිත නගරය

නගරය : රත්නපුර : නගර අංකය : 24

11.0 අයදුම්පත්‍ර

A4(21cmx29cm) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදසි දෙපැත්තම භාවිත කරමින්

(අ) අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු වන පිටුවටද,

(ආ) අංක 4 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙලකරගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව හා විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත.

(ඇ) අයදුම්පත්‍රයේ 1.1 යටතේ අයදුම්කරුගේ නම සඳහන් කිරීමේදී අයදුම්කරුගේ සම්පූර්ණ නමෙහි අගටම යෙදෙන කොටස පළමුව ලියා, පෙළපත් නාමයට අදාළ නම්වල මුලකුරු හා නමෙහි අනෙකුත් කොටස්වල මුලකුරු ඊළඟට වන සේ ලිවිය යුතුය.

උදා : අයදුම්පත්‍රයේ 1.2 අනුව සම්පූර්ණ නම - MATHURATA GAMARALALAGE BUDDIKA SARATH KUMARA PERERA නම්

උදා :අයදුම්පත්‍රයේ 1.1 හි - PERERA, M. G. B. S. K ලෙස ලිවිය යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය අලවා නොමැති, නියමිත සුදුසුකම් සහ අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. විභාග ගාස්තු ගෙවා ලබාගත්තා ලද කුවිතාන්සිය හැර වෙනත් කිසිදු සහතිකයක් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් නොකළ යුතුය.

11.1 අයදුම්පත්‍ර බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණය සහායක (කෘෂි ව්‍යාප්ති) III වැනි ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018 යන්න සඳහන් කරන්න.

11.2 අයදුම්පත්‍රය අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයකු දිවුරුම් කොමසාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු වාර්ෂික වැටුප රු. 240,360/= ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතුය.

11.3 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2018.06.04 දිනට හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**ලේකම්,**
**ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය හා ධීවර අමාත්‍යාංශය,**
**සබරගමුව පළාත් සභාව,**
**නව නගරය, රත්නපුර.**

12.4 අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

11. වලංගු විදේශ ගමන් බල පත්‍රය

13. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව සබරගමුව පළාත් ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම සත්ත්ව නිෂ්පාදන හා ධීවර අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

14. සිංහල හා දේමළ භාෂා මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**2018.04.27**

**පී. සුනිල් ප්‍රේමචන්ද්‍ර**
**ලේකම්, ඉඩම් පළාත් වාරිමාර්ග කෘෂිකර්ම සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව**
**සෞඛ්‍ය හා ධීවර අමාත්‍යාංශය,**
**සබරගමුව පළාත් සභාව.**

# ආදර්ශ අයදුම්පත්‍රය

**සබරගමුව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය

සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය

කෑගල්ල - 23
රත්නපුර - 24
(කොටුව තුළ අදාළ අංකය ලියන්න)

1.0 1.1 මුලකුරු අගට යොදු මුලකුරු සමග නම
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා PERERA M. G. B. S .K

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) : ..........

1.4 හැඳුනුම්පත් අංකය :

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........

2.2 ස්ථිර ලිපිනය (සිංහල / දෙමළ) : ..........

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........

2.4 පෞද්ගලික දුරකථන අංකය :

3.0 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය
0 - පුරුෂ
1 - ස්ත්‍රී
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය වර්ෂය මාසය දිනය

3.2 2018.06.04 දිනට වයස අවුරුදු මාස දින

4.0 4.1 සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිය ඇත්තේ අයදුම්කරුද? කලත්‍රයාද? යන වග :

4.2 උප දිසාපති / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..........

4.3 සබරගමුව පළාත තුළ පදිංචිව සිටින්නේ කවදා සිට ද?

4.4 ග්‍රාම නිලධාරී කොට්ඨාසය : ..........

5.0 අධ්‍යාපන සුදුසුකම්

5.1 අ.පො.ස (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර

I. විභාගයේ වර්ෂය හා මාසය : ..........
II. විභාග අංකය : ..........
III. ප්‍රතිඵල : ..........

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

6.0 වෘත්තීය සුදුසුකම්

6.1 කෘෂිකර්ම ඩිප්ලෝමාව පිළිබඳ විස්තර :

| ඩිප්ලෝමාව ලබාගත් ආයතනය | ඩිප්ලෝමාව සම්පූර්ණ කළ දිනය |
|---|---|
| | |

6.2 කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

| වෘත්තීය සුදුසුකම් ලබාගත් ආයතනය හා පාඨමාලාවේ නම | සුදුසුකම් සම්පූර්ණ කළ දිනය | NVQ මට්ටම |
|---|---|---|
| | | |

6.3 වෙනත් වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

| පාඨමාලාවේ නම | පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම | පාඨමාලාවේ කාල සීමාව | සුදුසුකම් සම්පූර්ණ කළ දිනය |
|---|---|---|---|
| | | | |

7.0 ඔබ කවරදක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් නැත

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

I. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : ..........
II. ලදුපතේ අංකය හා දිනය : ..........
III. ගෙවූ මුදල : ..........

**ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න**
**(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)**

9.0 අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය හා ධීවර අමාත්‍යාංශයේ ලේකම් විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බවද, ප්‍රකාශ කරමි.

දිනය අයදුම්කරුගේ අත්සන

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන .......... මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ ඇය මා ඉදිරිපිටදී .......... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාගය ගාස්තු ගෙවා ඇති බවද එම ලදුපත අලවා ඇති බවද, සහතික කරමි.

දිනය :

**සහතික කරන නිලධාරියාගේ අත්සන**

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ..........
තනතුර : ..........
ලිපිනය : ..........
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)